# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,370 - 2024 පෙබරවාරි මස 02 වැනි සිකුරාදා - 2024.02.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | — |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 34 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 පෙබරවාරි 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 පෙබරවාරි මස 09 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.''**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


33 - B 082537 — 353 (2024/02)
D 1 -

# විවිධ දැන්වීම්

**බස්නාහිර පළාත් මහාධිකරණය**

(තම සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන)

*නඩු අංකය* : HC CIVIL/104/2023/CO
*ස්වභාවය* : ගණන් බේරා වසා දැමීම
*වටිනාකම* : රු. 58,942,888.24
*පටිපාටිය* : සාමාන්‍ය

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස් පාර, අංක 257 දරන ස්ථානයේ පිහිටි සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PV9317 දරන එඩ්නා චොකොලට්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති සමාගම අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ කාරණාවේ දී ය.

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී,
අංක 21, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත,
කොළඹ 01.

*සහ*

කොළඹ 01, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත, අංක 21 දරන ස්ථානයෙ හි "විදේශීය ශාඛාව" වශයෙන් හඳුන්වන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් පිහිටා ඇත.

.........................*පෙත්සම්කරු.*

බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය (තම සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන) ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා,

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී,
අංක 21, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත,
කොළඹ 01.

විසින් **2023** දෙසැම්බර් මස **18** වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම **2024** මාර්තු මස **19** වැනි දින එකී අධිකරණය ඉදිරියේ ඇසිය යුතු බවට නියම කර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීමට සහයෝගය හෝ විරෝධය හෝ දැක්වීමට කැමති එකී සමාගමේ යම් ණයහිමියෙකු හෝ දායකයෙකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ අධිනීතිඥ මහතෙකු හෝ ලේඛනගත නීතිඥයෙකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බව මෙයින් දන්වනු ලැබේ. තව ද, පෙත්සමේ පිටපතක් ඒ සඳහා නියම කර ඇති ගාස්තු ගෙවීම මත එය අවශ්‍යවන සමාගමේ යම් ණය හිමියෙකුට හෝ දායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන්නේ ය.

නීතිඥ මොහොමඩ් කලීල් මොහොමඩ් ඉර්ෂාඩ්,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 180, බෞද්ධාලෝක මාවත, කොළඹ 04.

*සටහන.-*

එකී පෙත්සම ඇසීමේ දී පෙනී සිටීමට අදහස් කරන යම් පුද්ගලයෙකු, එසේ කිරීමට ඇති ඔහුගේ/ඇයගේ එම අදහස, ඉහත නම සඳහන් නීතිඥ, මොහොමඩ් කලීල් මොහොමඩ් ඉර්ෂාඩ් යන අය වෙත ලිඛිතව භාරදීම හෝ තැපැල් මගින් එවීම කළ යුතු ය. පුද්ගලයින්ගේ නම් සහ ලිපිනය හෝ නීති ආයතනයක් නම් එහි නම සහ ලිපිනය හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥයින් ඇත්නම් ලේඛනගත නීතිඥවරයාගේ නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීම අවශ්‍යවන අතර, **2024** මාර්තු මස **18** වැනි දින පස්වරු **6.00** ට පෙර ඉහත නම සඳහන් අයවලුන්ට ලැබෙන සේ කල්වේලා ඇතිව භාර කිරීම හෝ තැපැල් කරනුයේ නම්, එසේ තැපැල් කිරීම අවශ්‍ය වේ.

02-65

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### අජිත් රාජපක්ෂ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

වීරසුමන වීරසිංහ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 දරන ස්ථාවර නියෝගය යටතේ "අජිත් රාජපක්ෂ පදනම" සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

(අ) පාසල් ළමුන් සඳහා අතිප්‍රේරණ වැඩසටහන් තුළින් දිරිමත් කිරීම ;
(ආ) රටේ සමාජයීය, සංස්කෘතික හා ආර්ථික සංවර්ධනයට සහභාගි වීමට ;
(ඇ) ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා ආධාර ලබාදීම ;

යනාදිය වේ.

වීරසුමන වීරසිංහ,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

02-25

---

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### වට්ටක්කච්චි තමිළ් සංගම් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ශී. ශිරිතරන් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 දරන ස්ථාවර නියෝගය යටතේ "වට්ටක්කච්චි තමිළ් සංගම්" සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී අරමුදල සංස්ථාගත කිරීමයි :-

(අ) විද්‍යා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථාන පිහිටුවීම ;
(ආ) විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම ;
(ඇ) ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා ආධාර ලබාදීම ;

යනාදිය වේ.

ශී. ශිරිතරන්,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

02-27

---

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### කල්මුනයන්ස් ෆෝරම් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

එස්. එම්. එම්. මුෂාඵ්ප් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 දරන ස්ථාවර නියෝගය යටතේ "කල්මුනයන්ස් ෆෝරම්" සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ෆෝරම් සංස්ථාගත කිරීමයි :-

(අ) විද්‍යා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථාන පිහිටුවීම ;
(ආ) රැකියා නොමැති අයට ස්වයං රැකියා අවස්ථා ලබාදීම ;
(ඇ) රටේ සමාජයීය, සංස්කෘතික හා ආර්ථික සංවර්ධනයට සහභාගි වීමට ;

යනාදිය වේ.

එස්. එම්. එම්. මුෂාඵ්ප්,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

02-26

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2024 වර්ෂය** | | | | | |
| **පෙබරවාරි** | 2024.02.02 | සිකුරාදා | 2024.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.09 | සිකුරාදා | 2024.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.16 | සිකුරාදා | 2024.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.22 | බ්‍රහස්පතින්දා | 2024.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2024.03.01 | සිකුරාදා | 2024.02.16 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2024.03.07 | බ්‍රහස්පතින්දා | 2024.02.22 | බ්‍රහස්පතින්දා | දහවල් | 03.00 |
| | 2024.03.15 | සිකුරාදා | 2024.03.01 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2024.03.22 | සිකුරාදා | 2024.03.07 | බ්‍රහස්පතින්දා | දහවල් | 03.00 |
| | 2024.03.28 | බ්‍රහස්පතින්දා | 2024.03.15 | සිකුරාදා | දහවල් | 03.00 |
| **අප්‍රේල්** | 2024.04.05 | සිකුරාදා | 2024.03.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.10 | බදාදා | 2024.03.28 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.04.19 | සිකුරාදා | 2024.04.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.26 | සිකුරාදා | 2024.04.10 | බදාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.